දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපෑල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ්අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல ) NA/06/T/14/2017
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 2017.08.21
Date )

# සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதார,போசணைமற்றும் சுதேசவைத்தியஅமைச்சு
# Ministry of Health, Nutrition& Indigenous Medicine

පොදු චක්‍ර ලේඛ ලිපි අංක - 02-160/2017

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලංකා ජාතික රෝහල)
සියලුම ශික්ෂණ රෝහල් / මහ රෝහල් අධ්‍යක්ෂවරුන්,
සියලුම මූලික රෝහල් / විශේෂිත ආයතන ප්‍රධානීන් ඇතුළු
රේඛීය අමාත්‍යාංශය යටතේ පාලනය වන සියළුම ආයතන ප්‍රධානීන් වෙත.

**<u>මහරගම දන්තායතනය සඳහා හෙද නිලධාරී ස්ථාන මාරු කැඳවීම.</u>**

රේඛීය අමාත්‍යාංශය යටතේ පාලනය වන සියළුම රෝහල් හා ආයතන වල සේවය කරන, මහරගම දන්තායතනය සඳහා ස්ථාන මාරු ලබා ගැනීමට අපේක්ෂාවෙන් සිටින හෙද නිලධාරින්ගෙන්/නිලධාරිණින්ගෙන් 2017 වර්ෂය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02 ස්ථාන මාරු ලබා ගැනීමට අපේක්ෂා කරන, පහත අවශ්‍යතා සපුරා ඇති නිලධරයන් ඇමුණුම 01 මඟින් දැක්වෙන ආකෘතියට අනුකූලව ස්ථාන මාරු අයදුම් කළ යුතුය..

I. **2017.06.30** දිනට එක් සේවා ස්ථානයක වසර හතරක (04) අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කරන ලද **III** ශ්‍රේණිය, **II** ශ්‍රේණිය, **I** ශ්‍රේණියට හා අධි ශ්‍රේණියට උසස්වීම් ලද නිලධරයන්.

II. මහරගම ජාතික පිළිකායතනය, ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතනය, වැලිසර ළය රෝහල හා අංගොඩ මූලික රෝහල (අයි.ඩී.එච්.) හි සේවය කරන **2017. 06.30** දිනට වසර දෙකක (02) සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධරයන්.

III. නියමිත සේවා කාලය සම්පූර්ණ නොකළ ද, ආබාධිත දරුවන්, දීර්ඝකාලීන අසනීප මත එක්තැන්ව සිටින කලත්‍රයන් සහ වෛද්‍ය හේතූන් මත වැනි සාධාරණ හේතු සහිත ස්ථාන මාරු අපේක්ෂිත නිලධරයන් (වෛද්‍ය හේතූන් මත ස්ථාන මාරු ඉල්ලුම් කරන නිලධරයන් පිළිගත හැකි වෛද්‍ය සහතිකය ස්ථාන මාරු අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය)

03. මීට පෙර වර්ෂවල වාර්ෂික ස්ථාන මාරු යටතේ යම් නිලධාරියෙකුට මහරගම දන්තායතනය වෙත ස්ථාන මාරු ලැබී තිබේනම් එම ස්ථාන මාරු නියෝග මින් අවලංගු කරන අතර ඔවුන්ද නැවත අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත් මින් පෙර මහරගම දන්තායතනය සඳහා වාර්ෂික ස්ථාන මාරු අයදුම්කර, පුරප්පාඩු නොමැතිවීම හේතුවෙන් වෙනත් සේවා ස්ථානයක් සඳහා ස්ථාන මාරු ලබා ඇති නිලධාරින්ට නැවත අයදුම්පත් ඉදිරිපත් කිරීමේ හැකියාව ඇති අතර, එම නිලධාරින් පෙර වසරේ අයදුම්කළ අයදුම්පතේ පිටපතක් ද එයට අමුණා එවිය යුතුය. ඔවුන්ගේ සේවා කාලය සැළකීමේදී පෙර සේවා ස්ථානයේ සේවා කාලය සළකා බලා ස්ථාන මාරුව ලබා දෙනු ලැබේ.

03. අයදුම් කල යුතු ආකාරය

I. ස්ථාන මාරු ඉල්ලීමේදි සලකා බලනු ලබන්නේ ඒ සඳහා සකස් කර ඇති ආකෘති පත්‍රයට අනුකූලව ම ඉදිරිපත් කරන අයදුම්පත් පමණි. තවද මීට පෙර ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කර තිබුණ ද, ස්ථාන මාරු නියෝගයක් ලැබී නොමැති, නිලධාරීන් ද මෙම චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාන මාරු අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය. එසේම දැනටමත් මහරගම දන්තායතනයට හෝ වෙනත් රෝහලකට ස්ථාන මාරු නියෝග ලබා සිටියද, ස්ථාන මාරු නියෝග අනුව නව සේවා ස්ථාන වලට මුදා හැර නොමැති නිලධාරීන් අතුරින් යම් කෙනෙකුට මහරගම දන්තායතනය සඳහා ස්ථාන මාරු වීමට අවශ්‍ය නම් ඔවුන්ද මේ අනුව අයදුම් කළ යුතුය.

II. සෑම නිලධාරියෙක් පිළිබඳවම නිවැරදි හා සම්පූර්ණ තොරතුරු සැපයීමට සෑම ආයතන ප්‍රධානියෙක් ම වග බලා ගත යුතුය. එමෙන්ම මෙම නිවේදනයේ සඳහන් කරුණු ආයතනයේ සියළුම හෙද නිලධරයන්ට (ප්‍රසූත නිවාඩු , විශේෂ නිවාඩු ලබා සිටින නිලධරයන් ඇතුලත්ව ) දැන ගැනිමට සැලැස්විය යුතුය. සාවද්‍ය තොරතුරු සැපයීමෙන් හෝ සුදුසුකම් ලත් නිලධරයන්ට අයදුම් කිරිමට අවස්ථාව නොලැබීමෙන් හෝ ඇති වන අපහසුතාවයන් පිළිබඳව මෙම අමාත්‍යාංශය වග නො කියන අතර, ඒ සම්බන්ධව ඒ ඒ නිලධාරින් වගකීමට බැඳෙන බව අවධාරණය කරමි.

III. සියළුම ස්ථාන මාරු අයදුම්පත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව අධ්‍යක්ෂ (පාලන) 01, සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. යන ලිපිනයට ලේඛනගත තැපැලෙන් එවීමට හෝ අතින් ගෙනවිත් භාර දිමට කටයුතු කල යුතුය. කිසිදු හේතුවක් නිසාවත් නිලධරයෙකු විසින් පෞද්ගලිකව ගෙනවිත් දෙන අයදුම්පත් භාර ගනු නොලැබේ. මෙම නිවේදනයට පරිබාහිර සෑම අයදුම්පතක්ම දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

IV. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2017.09.11 දින වන අතර, එදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාර නො ගන්නා බව යලිත් අවධාරණය කරමි.

සැලකිය යුතුයි -

i. මෙම චක්‍රලේඛය මගින් මහරගම දන්තායතනයේ මේ වන විට අනුමත කාර්යමණ්ඩලයට අනුව පවතින පුරප්පාඩු සඳහා පමණක් ස්ථාන මාරු ලබාදෙන අතර, අයදුම් කරන සියලු දෙනාටම ස්ථාන මාරු ලබාදෙන බවක් මෙහි අඩංගු වගන්ති කිසිවකින් අදහස් නොවන අතර, එසේ තේරුම්ගත යුතුද නොවේ.

ii. ලැබෙන අයදුම්පත් ස්ථාන මාරු මණ්ඩලයකට යොමු කර ස්ථාන මාරු ලබාදෙන අතර, මෙහිදී අදාළ නිලධාරින්ගේ මුල් පත්වීම් දිනය සළකා ජ්‍යෙෂ්ඨතා ලේඛනය සකස් කරනු ලැබේ. එකම දිනයේ පත්වීම් ලද නිලධාරින්ගේ හෙද පුහුණුව අවසානයේ පවත්වන ලද විභාගයේ කුසලතාව අනුව ජ්‍යෙෂ්ඨතාව තීරණය කරනු ලැබේ.

iii. ප්‍රතිකාර සේවාව යාවත්කාලීනව පවත්වාගෙන යාම මානව සම්පත් කළමණාකරණයේ මූලික අරමුණ බැවින්, පුරප්පාඩු පවතින සේවා අවශ්‍යතාවය ඇති, හෙද නිලධාරීන්ගේ ස්ථාන මාරු සලකා බලන නමුදු, අනුප්‍රාප්තිකයන් රහිතව රෝහල් ප්‍රතිකාර සේවාව අඩාල වන ආකාරයෙන් මුදා නොහරින බව අවධාරණය කරමි.

06. මෙම නිවේදනයේ සඳහන් කරුණු ඔබ ආයතනයේ සෑම හෙද / හෙදි නිලධරයෙකුටම දැන්වීමට කටයුතු කරන්න. මෙහි සඳහන් නොවන ස්ථාන මාරු සම්බන්ධව බලපාන වෙනත් කරුණු සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහය ප්‍රකාරව අවසන් තීරණය මා විසින් ගනු ලබන බවත් සඳහන් කරමි.

ජනක සුගතදාස
ලේකම්
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ජනක සුගතදාස
ලේකම්,
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.